# ධාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

38 වන කාණ්ඩය | 02 වන කලාපය | 2021 නොවැ-දෙසැ කලාපය





## කාන්තාවන්ට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීමේ

# ජාත්‍යන්තර දින සැමරුම

කාන්තාවන්ට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීමේ ජාත්‍යන්තර දිනය නොවැම්බර් මස 25 වන දිනට යෙදී ඇති අතර මෙදින සිට දෙසැම්බර් 10 වන දින, එනම් ජාත්‍යන්තර මානව හිමිකම් දිනය දක්වා දින 16 ඇතුළත කාන්තාවන්ට එරෙහි හිංසනයන් පිටු දැකීමේ 16 දින ක්‍රියාකාරීත්වය වශයෙන් දියත් වේ. මෙම වසරේ අනෙක් විශේෂත්වය නම් මෙවර දින 16 වැඩපිළිවෙළේ 30 වන සංවත්සරය යෙදී තිබීමයි. ඊට සමගාමීව ධාබිඳු සාමූහිකය විසින් 'වැඩ ලෝකය තුළ ස්ත්‍රී හිංසනයන් පිටුදකිමු' යන තේමාව ඔස්සේ 2021 නොවැම්බර් 21 දින සැමරුම් වැඩසටහනක් සංවිධානය කරන ලදි. මේ සඳහා කටුනායක සහ බියගම කම්කරුවන් පිරිසක් සම්බන්ධ වූ අතර කිලිනොච්චි සහ වව්නියා කම්කරුවන් පිරිසක් ZOOM හරහා සම්බන්ධ වූහ. මෙම වැඩසටහන සඳහා War on Want විසින් ප්‍රධාන දායකත්වය සපයන ලදී.

පොල්තෙල් පහන් දැල්වීමෙන් සහ පිළිගැනීමේ නර්තනයකින් දවසේ වැඩ කටයුතු ආරම්භ විය. අනතුරුව ධාබිඳු සාමූහිකයේ වැඩසටහන් සම්බන්ධීකාරිකා විසින් පැමිණ සිටි සියලු දෙනා පිළිගනිමින් දවසේ අරමුණ ද පැහැදිලි කළාය. තවද,

4 වන පිටුවට...

## ඇතුළු පිටු


**03 පිටුව** - ගැබ්ගෙල පිළිකාවට එරෙහි එන්නතක්

**04-05 පිටුව** - කාන්තාවන්ට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීමේ ඉතිරිය

**06-07 පිටුව** - අපේ වැඩ

**08 පිටුව** - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නූතන වහල් භාවය

**09 පිටුව** - සිතුවිල්ල

## ඩාබිඳු සාමුහිකය

221, වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka


# නැවුම් වූ ආර්ථික හා සමාජ සංවර්ධන මාවතක්

මේ වන විට රටේ අති බහුතරයක් වූ මහජනතාවට අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟයකට මුහුණ පෑමටත්, කෘෂිකර්මාන්තය කරගෙන යෑමට අවශ්‍ය පොහොර ඇතුළු අනෙකුත් දෑ නොමැතිවීමත්, කොවිඩ් අර්බුදයේ ගොදුරු බවටත් පත් වෙමින් අන්ත අසරණ තත්ත්වයට පත්ව මුහුණපාන්නට සිදුව ඇත.

විවිධ කොන්දේසි මත වර්තමාන ආණ්ඩුව විසින් ලබා ගත් ණය පියවා ගැනීමට නොහැකි ලෙස ආර්ථික වශයෙන් රට බංකොලොත් වී හමාර ය. එසේ ම අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීම සඳහා මුදල් නොමැති නිසා භාණ්ඩ හිඟයක් රට පුරා පවතී. මේ ලෙස ආර්ථික හා සමාජීය වශයෙන් කඩා වැටීම නිසා රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ව්‍යවසායකයින් ආර්ථික අර්බුදයකට මුහුණ පා සිටී.

ඇඟලුම් සංක්‍රමණික, තේ වතු හා සංචාරක ව්‍යාපාර වල නියැලී සිටින කම්කරුවන්ට ඔවුන්ට හිමි මූලික වැටුප පවා කප්පාදු කර ගනිමින් රැකියා සුරක්ෂිතභාවයත්, ආරක්ෂණයක් නොමැතිව සිටී. කොවිඩ් පසුබිමක් තුළදී පවා වංචා, දූෂණ නාස්තිය වළක්වා ලීමට රජය අපොහොසත් වී ඇත.

සෑම වසරකම වාගේ මෙවර අයවැයෙනුත් කම්කරුවා අපේක්ෂාභංගත්වයට පත් කරමින් යුද්ධය අවසන් වී දශක දෙකකට ආසන්න කාලයකදී පවා ආරක්ෂක අංශ සඳහා මෙවරත් අධ්‍යාපනය සහ සෞඛ්‍යයට වඩා ප්‍රතිපාදන වෙන් කොට ඇත. මෙවැනි අදූරදර්ශී පාලනයකින් තොර සමාජ, ආර්ථික සහ දේශපාලනමය ප්‍රතිපත්ති තුළින් ප්‍රජාතන්ත්‍රවාදයේ අර්ථය භුක්ති විඳීමට හැකි නිදහස් නිවහල් අපේක්ෂාවක් බලාපොරොත්තු එල ගන්වන රටක් උරුම කර ගැනුමට මහජනතාව පෙළ ගැසිය යුතුය.

# තාරුණ්‍යයේ හෙට දවස


සියය තාරුණ්‍ය නිදහස් වෙළඳ කලාප තුළට දියකර හරිමින් ගෙවන ජීවිතය කටුක වුවත්, නීරස වුවත් සියල්ල විඳ දරා ගනිමින් ඔවුන් වෙළඳ කලාප තුළ සේවය සඳහා පැමිණියේ රැකියා අර්බුදයට විසඳුමක් ලෙසත් තම පවුලේ ආර්ථික ප්‍රශ්න වලට මදක් හෝ අස්වැසිල්ලක් ලබා ගැනීමේ අරමුණින් ය.

ඔවුන් වෙහෙස දරා උපයාගත් මුදල් වියදම් කළේ ඉතා අරපිරිමැස්මෙනි. පවතින ආර්ථික අර්බුදය හා කොවිඩ් වසංගතය නිසා කොයි මොහොතේ කම්හල් වැසී යයි ද යන්න ඔවුන්ගේ සිත් තුළ දැවෙන ප්‍රශ්ණයක් විය. පවතින ආර්ථික ප්‍රශ්න තුළ අපට ලැබෙන වැටුප ප්‍රමාණවත් නොවූවත් ගෙදර ගොස් මොනවා කරන්නද? කැත්ත, උදැල්ල හා කුඹුරු වල වැඩ කිරීමට ශක්තියක් ධෛර්යයක් ඔවුන්ට නැත. කෘෂිකර්මාන්ත වල බොහෝ අය වැඩ කරන්නේ යන්ත්‍ර සූත්‍ර මඟිනි. එම නිසා එහි වැඩ කරන සේවක පිරිස ද අඩුවී ඇත. සමහර අය රටේ පවතින ඉසිලිය නොහැකි අනවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ යාම තුළ සමහරු විදෙස්ගත වීමට උත්සාහ දරති.

අප රටේ ජනතාව ඇඟලුම් මත ජීවත් වූවන් නොවේ. කෘෂිකර්මාන්තය හා කාර්මීකරණය බිඳ වැටීමත් සමඟ බිහිවූ ඇඟලුම් කර්මාන්තයට විවෘත ආර්ථිකය නිසා විශේෂ තැනක් ලැබුණු අතර එයින් සිදු වූයේ යටත් විජිතවාදයෙන් මුදවාගත් රට නැවත ඔවුන්ට නතු වීමය.

ප්‍රජාතන්ත්‍රවාදීව ජීවත් වීමට නම්, අප රට තුළ ආර්ථික ශක්තියක් උදෙසා ධන සම්පත් අපට නොමැති නිසා ණය ආධාර ලබා ගැනීමට ද සිදු වී ඇත. දැනට ද අප රට තුල පවතින විවිධ ව්‍යවසනයන් නිසා රට තුළ ඇති වූ පරිහානිය අතිවිශාලය. එය නැවත සංවර්ධනය කිරීමට කලක් ගතවනු ඇත. එනමුත් වෙනත් විකල්ප වැඩපිළිවෙලක් රට තුළ නොමැති නිසා රට ආගාධයට වැටෙමින් පවතී.

හෙට්ටිආරච්චි



# ගැබ්ගෙල පිළිකාවට එරෙහි එන්නතක්

රෝගකාරක වෛරස සහ බැක්ටීරියා නිසා මිනිස් සිරුරේ ඇති වෙන ආසාදන සහ රෝගාබාධ බොහෝ විට කෙටිකාලීන විය හැකි වුණත් ඇතැම් රෝගකාරක කාලාන්තරයක් පැවතීම නිසා කාලයත් සමග පිළිකා තත්ත්වය දක්වා වර්ධනය විය හැකියි.

ගැබ්ගෙල පිළිකාව ශ්‍රී ලංකාවේ කාන්තාවන් අතර දක්නට ලැබෙන දෙවැනියට බහුල පිළිකාවයි. සෑම වසරකදී කාන්තාවන් 1,407ක් ගැබ්ගෙල පිළිකා තත්ත්වයට ගොදුරු වෙන අතර එයින් 780 ක්ම මිය යනු ලැබේ. නමුත් ගැබ්ගෙල පිළිකාව යනු වළක්වා ගත හැකි රෝගී තත්ත්වයක්. මානව පැපිලෝමා නැතහොත් හියුමන් පැපිලෝමා (Human Papillomavirus - HPV) නැමැති වෛරසයෙන් ආසාධනය වීමන් තමයි ගැබ්ගෙල පිළිකාව සැදෙන්නෙ.

මානව පැපිලෝමා යනු එකිනෙකට වෙනස් වෛරස වර්ග සියයකින් පමණ සමන්විත වෛරස කාණ්ඩයක්. මෙහි අඩුම වශයෙන් පිළිකා කාරක වර්ග දහහතරක් පමණ අඩංගු වෙනවා. මානව පැපිලෝමා වෛරසය බොහෝ විට ලිංගිකව සම්ප්‍රේෂණය වෙන අතර වෛරසයේ සම්ප්‍රේෂණය නිසා ගැබ්ගෙල පිළිකා තත්ත්වය ඇති වීමට ඉඩ තිබෙනවා.

**ගැබ්ගෙල පිළිකාවක මූලික ලක්ෂණ**

- යෝනි මාර්ගයෙන් අක්‍රමවත් රුධිර වහනය.
- ලිංගික සංසර්ගයෙන් පසු රුධිරවහනය.
- යෝනි මාර්ගයෙන් අධික දුර්ගන්ධ ශ්‍රාවයක් පිටවීම.
- ඔසප් වීම නැවතී ඇති කාන්තාවන්ගේ යෝනි මාර්ගයෙන් රුධිරය පිටවීම.

ගැබ්ගෙල පිළිකා ඇති වෙන්නෙ වෛරස මගින් වන අතර ඊට එරෙහි එන්නතක් මගින් විෂබීජය බොහෝ දුරට මර්ධනය කළ හැකි බැව් ඔවුන්ගේ අදහසයි. එන්නතක් ලබා ගත් අයට ගැබ්ගෙල පිළිකා හඳුනා ගැනීම සඳහා වූ පැප් පරීක්ෂණ වෙනුවෙන් යොමු වන අවස්ථාවන්ද මේ නිසා අඩු වන බැව් පර්යේෂකයන්ගේ අදහසයි.

11 වන පිටුවට...

1 පිටුවෙන්... **කාන්තාවන්ට එරෙහි**




ඇය කාන්තාවන් මුහුණ පාන හිංසනයන් සම්බන්ධව සංඛ්‍යා දත්ත ඇසුරෙන් විස්තර කළාය. ශ්‍රී ලංකාව තුළ ප්‍රවාහනයේ දී කාන්තාවන් 90%ක් හිංසනයට ලක්වන බවත්, සෑම කාන්තාවන් තුන්දෙනෙකුගෙන් එක් අයෙක් ලිංගික හිංසනයට හෝ ප්‍රචණ්ඩත්වයට ලක්වන බවත් පෙන්වා දුන්නාය. ගෝලීය වශයෙන් ගතහොත් පිරිමි තුන්දෙනෙකුගෙන් එක් අයෙක් තමන් කාන්තාවන්ට එරෙහි කිසියම් හිංසනයක් සිදුකර ඇති බව දක්වා තිබුණ ද 5%ක් වත් එම හිංසනයන් වාර්තා වී නැත. එහෙයින් කාන්තාවන් විසින් ඊට එරෙහි විය යුතු බවත්, විශේෂයෙන්ම කම්කරු කාන්තාවන් වශයෙන් ඔවුන්ට හිමි අයිතීන් සහ ඒවා රැක ගැනීමට උත්සුක විය යුතු බවත් අවධාරණය කළාය.

ඉන් අනතුරුව ඩාබිඳු කටුනායක සාමාජිකාවක් විසින් වැඩපළ තුළ තමන් මුහුණ දෙන ප්‍රචණ්ඩත්වයන් සම්බන්ධව ඇගේ අත්දැකීම් බෙදා ගත්තාය. විශේෂයෙන්ම කොවිඩ් සමය තුළ කම්කරුවන් ලෙස තමන්ට විඳින්නට සිදු වූ දුක් ගැහැට මෙන්ම රජය විසින් සපයන ලද සේවාවන් ලබා ගැනීමට යාමේදී රාජ්‍ය නිලධාරීන්ගේ අසාධාරණ සැලකීම් වලට ලක්වීමට සිදුවූ ආකාරය විස්තර කළාය. තවද තමන්ට කිසියම් ගැටලුවක් මතු වූ අවස්ථාවන්හිදී පොලිසිය වෙත පැමිණිලි කිරීමට යාමේදී පොලිස් නිලධාරීන්ගෙන් සිදුවූ නොමනා සැලකීම් සම්බන්ධව ද අත්දැකීම් ඉදිරිපත් කළාය. ඉන් අනතුරුව බියගම සාමාජිකාවක් විසින් ඔවුන් වැඩපල තුළ සහ මඟතොටේ දී හිංසනයන්ට ලක්වන අයුරු ඉදිරිපත් කළාය. කිලිනොච්චි සාමාජිකාවක් විසින් ඔවුන් වැඩපළ තුළ මුහුණ දෙන ගැටලු සහ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් උග්‍ර වී ඇති ගැටලු සම්බන්ධව අදහස් ZOOM තාක්ෂණය ඔස්සේ එක්වෙමින් බෙදා ගත්තාය.

ඉන් අනතුරුව කටුනායක පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තමරා කුමාරි විසින් සිය ක්ෂේත්‍ර අත්දැකීම් විස්තර කරමින් කම්කරු කාන්තාවන් මුහුණ පාන හිංසනයන් පෙන්වා දුන්නාය. කටුනායක නිදහස් වෙළඳ කලාපය තුළ වයස අවුරුදු 17-20 අතර තරුණ කම්කරු ප්‍රජාවේ වැඩිවීමක් දක්නට ලැබෙන අතර මෙම වයස් කාණ්ඩයේ තරුණියන් ගැබ් ගැනීමේ වැඩි ප්‍රවණතාවයක් ද ඇති බව සඳහන් කළාය. එසේම සමීපතමයන්ගෙන් සිදුවන හිංසනයන්හි වැඩිවීමක් ද දක්නට ලැබෙන නමුත් ඒවා පොලිසියට වාර්තාවීම් අවම බව ඇය වැඩිදුරටත් සඳහන් කළාය. ඊට මූලිකම හේතුව මෙවන් තත්වයන් වාර්තා කිරීමේදී පොලිසියේ ප්‍රතිචාරය වන්නේ එම පිරිස් අදාළ නේවාසිකාගාරයෙන් පිට කරන ලෙස දැනුම් දීමයි. එහෙයින් තරුණ යුවළ අතර අඩදබර ඇති වීමේදී නේවාසිකාගාර හිමියන් විසින් පොලිසියට දැන්වීමෙන් වැළකී සිටීමට හෝ ඔවුන් අදාළ නේවාසිකාගාරයෙන් පිටව යන ලෙස දැනුම් දීමට හෝ කටයුතු කරයි. යම්කිසි හිංසනයක් සිදුවනනේ නම් තමන් දැනුවත් කරන ලෙස ගැබිණි මව්වරුන්ට දැනුම් දී තිබුණත් කොවිඩ් වසංගත තත්වය හමුවේ තමන්ට ද පැවරී ඇති අධික රාජකාරී හේතුවෙන් ඉක්මණින් ක්‍රියාත්මක වීමේ අපහසුතාවයක් පවතින බවත් ඇය ප්‍රකාශ කළාය. එහෙයින් කාන්තා සහ කම්කරු සංවිධාන මගින් නිදහස් වෙළඳ කලාප කම්කරු කාන්තාවන් වෙනුවෙන් ලබා දෙන සේවාව අගය කළ

5 වන පිටුවට...

4 පිටුවෙන්... **කාන්තාවන්ට එරෙහි**



යුතු බවත් ඇය වැඩිදුරටත් සඳහන් කළාය. අවසන් වශයෙන් ඇය සඳහන් කළේ කාන්තාවන් දැනුවත් විය යුතු බවත්, හිංසනයන් හමුවේ නීතියේ පිහිට ලබා ගැනීමට ඉදිරිපත් විය යුතු බවත්ය. රාජ්‍ය අංශය තුළ පොලිසිය හා කාන්තා කාර්යාංශය මේ සම්බන්ධව මීට වඩා ක්‍රියාත්මක විය යුතු බවත් විශේෂයෙන්ම හවස් වරුව තුළ කම්කරු කාන්තාවන් වැඩ නිමවී පවුල තුළ ගත කරන කාලයේ ඇතිවන ගැටලු විසඳීම සඳහා යම් කිසි ක්‍රියාමාර්ගයක් ගත යුතු බවට යෝජනා කළාය.

අනතුරුව ආරාධිත දේශනය නීතිඥ කෞෂල්‍යා ආරියරත්න විසින් ඉදිරිපත් කළාය. හිංසනය සාමාන්‍යකරණය වූ සමාජයක කාන්තාවකට සිදුවන හිංසනය ආමන්ත්‍රණය කිරීම කෙතරම් අභියෝගයක් ද යන්න පැහැදිලි කළාය. ප්‍රචණ්ඩත්වයේ තෙවැදෑරුම් ආකාර පැහැදිලි කරමින් ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය රාජ්‍ය ක්‍රමයේ පටන් පහළටම ගලා එන ආකාරය උදාහරණ සහිතව පෙන්වා දුන්නාය. සංකේතාත්මක ප්‍රචණ්ඩත්වය ආදරයේ මුවාවෙන් හිංසනයට ලක්වන සහ ඇතැම් විට එය හිංසනයක් ද යන්න වටහා ගැනීමට පවා කාන්තාවන් අපොහොසත් වන ආකාරය පෙන්වා දුන්නාය. තවද ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය සම්බන්ධව පැහැදිලි කරමින් සමාජය තුළ පවතින අගතිගාමී ආකල්ප තුළින් කාන්තාවන් පමණක් නොව පිරිමින් මෙන්ම අනෙකුත් ලිංගික සුළුතර ප්‍රජාවන්ද පීඩාවට පත් කරන බව සඳහන් කළාය. එහෙයින් හිංසනය යනු තමන්ට සිදුවන දෙයක් පමණක් නොව තමන්ගෙන් අනෙකාට සිදුවන්නක් ද විය හැකි බව ඇය පෙන්වා දුන්නාය.

හිංසනයන්ට එරෙහිව කළ හැකි දේ සම්බන්ධව අදහස් දක්වමින් ඇය කියා සිටියේ එහි පළමු වගකීම ඇත්තේ රජයට බවයි. නමුත් වර්තමානයේදී වෙනම කාන්තා අමාත්‍යාංශයක් හෝ නොමැති අතර එහි කර්තව්‍යයන් දක්වා ඇත්තේ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා යන රාජ්‍ය අමාත්‍යාංශය යටතේය. රටේ ජනගහනයෙන් 52%ක් වන කාන්තාවන් වෙනුවෙන් පැවති එකම අමාත්‍යාංශයත් අහෝසි කිරීම තුළින් රජය විසින් කාන්තාවට ලබා දී ඇති සැලකීම කොතෙක් ද යන්න ඉන් පැහැදිලි වන බවයි. එසේම අයවැය තුළින් මෙතෙක් ලබා දුන් ප්‍රතිපාදන 25%ක් ජාතික ආරක්ෂාව තර කිරීම වෙනුවෙන් කපා හැරීමට ලක් කර ඇත. එහෙත් කාන්තාවකට තනිවම රෑට නිවසේ සිටින්නට නොහැකි, ගැහැණු දරුවකුට තනිවම මහමඟ යන්නට නොහැකි, රැකියාවට යන මවකට දරුවන් ආරක්ෂිතව තබා යා හැකි දිවා සුරැකුම් මධ්‍යස්ථාන හෝ වටපිටාවක් නොමැති රටක ජාතික ආරක්ෂාව කුමක්ද? යන්න ඇය ප්‍රශ්න කළාය. රජය මගින් ක්‍රියාත්මක වන ආරක්ෂිත නිවාස මුළු රටටම ඇත්තේ 7ක් පමණක් බවත්, වසරකටම ඉන් සේවා සැපයෙන්නේ කාන්තාවන් 300කට තරමක් වැඩි ප්‍රමාණයකට බවත් ඇය ප්‍රකාශ කළාය. එසේම ILO C190 කැබිනට් පත්‍රිකාව මාර්තු මස සම්මත වුවත් මේ වනතෙක් කිසිදු නීතියක් කෙටුම්පත් කර නොමැති බව ඇය ප්‍රකාශ කළාය.

අනතුරුව ඇය පෙන්වා දුන්නේ හිංසනය වැළැක්වීමට හිංසනය වටහා ගැනීමත් වැදගත් බවයි. 2005 වසරේ නීතිගත කළ ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව පණතට අනුව පවුල තුළ හිංසනයක් සිදුවීම එය තවදුරටත් පෞද්ගලික කාරණයක් නොව එය නීතියේ පිහිට ලබා ගත හැකි තත්වයකි. එහෙයින් තමන්ගේ නිවස තුළ වැඩපළ තුළ පවතින හිංසනයන් සම්බන්ධව නිහඬව නොසිට ඒ සම්බන්ධව හඬ නැගීම, කාන්තාවන් වශයෙන් ඒකරාශී වීම සහ කාන්තාවන් වෙනුවෙන් ක්‍රියාත්මක වන සංවිධාන වල සහාය ලබා ගන්නට ඇය ආරාධනා කළාය. අවසන් වශයෙන් පවුල තුළ යම්කිසි ගැටලුවක දී පොලිසියට පැමිණිලි කිරීමේ ක්‍රමවේදය, නීති ආධාර කොමිසම හරහා නොමිලේ නීති ආධාර ලබා ගන්නා ආකාරය සහ ආරක්ෂිත නිවාසයක රැකවරණය අවශ්‍ය නම් ඒ සඳහා කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන සහ එම ක්‍රමවේදයන් පිළිබඳව පැහැදිලි කළාය.

පැවති සීමිත කාලය හමුවේ කෙටි පොදු සාකච්ඡාවකින් අනතුරුව ස්තූතියකින් වැඩසටහනේ අවසානය සනිටුහන් කරන ලදී.





# කිළිනොච්චි සහ වව්නියා දිස්ත්‍රික්වල ක්‍රියාකාරී කමිටු රැස්වීම්

2021 නොවැම්බර් මස 14 වන දින කිලිනොච්චි සහ වවුනියා දිස්ත්‍රික්ක වල ක්‍රියාකාරී කමිටු රැස්වීම සූම් තාක්ෂණය හරහා පවත්වන ලදි. මේ සඳහා කිලිනොච්චි සාමාජිකාවන් හා වවුනියාවෙන් සාමාජිකාවන් සහභාගිවන ලදි. මෙහිදී ප්‍රධාන වශයෙන් ආයතන තුල පවතින ගැටළු හා ඉදිරි වැඩ සටහන් පිළිබඳ සාකච්ඡාවට බඳුන් වූයේය.

- මේ දිනවල කොරෝනා ආසාධිතයින්ගේ අඩුවීමක් දක්නට ඇති අතර උණ, කැස්ස වැනි රෝග ලක්ෂණ පහල වූ විට ආයතනය මගින් පී.සී.ආර්. නොකරන අතර රෝහල වෙත යොමු කරයි.
- දිනකට ඇන්ටිජන් පරීක්ෂා සිදු කරනු ලබන්නේ දහයකට (10) අඩුවෙනි.
- සතියකට මුව ආවරණ දෙකක් දෙනු ලබන අතර, මෙය රෙදි වලින් මසා ඇති අතර සෝදා නැවත භාවිත කළ හැක.
- සෙනසුරාදා අනිවාර්යෙන් වැඩ කළයුතු දිනයක් ලෙස නම් කර ඇත.
- නිෂ්පාදන ඉලක්ක ඉහළ දමා ඇති නිසා ඉලක්ක සපුරාලීම අසීරු වී ඇත.
- සමහර ආයතන වල සතියකට පැය 2 අතිකාල සේවා ඇත.
- සමහර ආයතන වල ආසාධිතයන් නිවෙස් තුල නිරෝධායනයට ලක් කරන අතර රුපියල් 3000 - 5000 අතර ආහාර මල්ලක් ලබා දෙනු ලබයි.
- කොරෝනා ආසාධිතව නිරෝධායන පිරිස වැඩි නිසා හදිසි අවස්ථාවක දී පවා නිවාඩුවක් ලබා ගැනීමට හැකියාවක් නොමැත.
- තවමත් සෙරෙප්පු දමා ගෙන ආයතනය තුලට යාමට නොහැක.
- පෝෂණීය ආහාරයක් නොලැබෙන අතර ආහාර ද කෑමට නුසුදුසු තත්වයේ ඇත.



# වෛද්‍ය සායනය කටුනායක





ඔක්තෝබර් 24 වන ඉරුදින ඩාබිඳු විසින් කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ වැඩ කරන කම්කරු කාන්තාවන් වෙනුවෙන් සුවනාරී කාන්තා වෛද්‍ය සායනයක් සීදුව සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයේ සමගාමී දායකත්වයෙන්, ඩාබිඳු කාර්යාල පරිශ්‍රයේදී සංවිධානය කරන ලදී.

මෙදින දී රුධිර පීඩනය පරීක්ෂාව, රුධිර සීනි පරීක්ෂාව, BMI අගය මැනීම, පැප් පරීක්ෂාව සහ Monography පරීක්ෂණ ඇතුළු පරීක්ෂණ රැසක් පැවැත් වූ අතර එම පරීක්ෂණ ප්‍රතිඵල අනුව පෙනී යන්නේ කලාපයේ කාන්තාවන් අතර බෝ නොවන රෝග පැතිරීමේ ප්‍රවණතාවක් පවතින බවයි. ඒ අතරිනුත් අධික රුධිර පීඩනය හා දියවැඩියාව සුලභව දක්නට ලැබේ.



ඉහත පරීක්ෂණ වලට අමතරව වෛද්‍ය පී. ප්‍රනාන්දු මහතා විසින් සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක ඇති වැදගත්කම,ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය, පියයුරු පිළිකා සහ ගැබ්ගෙල පිළිකා නිවාරණය යනාදී කාලීන මාතෘකා සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරමින් පැමිණ සිටි පිරිස දැනුවත් කිරීමක් ද සිදු කරන ලදී.







# එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නූතන වහල් භාවය සම්බන්ධ විශේෂ වාර්තාකරු ඩාබිඳු සාමූහිකය මුණගැසේ

රජයේ නිළ ආරාධනාවක් මත නූතන වහල්භාවය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත Tomoya Obokata මහතා පසුගිය නොවැම්බර් මස විශේෂ නිරීක්ෂණයක් සඳහා ලංකාවට පැමිණි අතර එහිදී විශේෂයෙන් වතු කේෂ්ත්‍රය, ඇඟළුම්, ලිංගික සැපයුම් සේවා පිළිබඳව සහ ගෘහ සේවය ආශ්‍රිතව (ක්ෂුද්‍ර මූල්‍ය ණය වලට ගොදුරුවූවන්) විශේෂ අධ්‍යයනයක් කළ අතර එහිදී ඩාබිඳු සාමූහිකයට ද පැමිණ ඇඟළුම් ක්ෂේත්‍රයේ කම්කරු තත්වය පිළිබඳ තත්ව වාර්තාවක් ක්ෂේත්‍රයේ නියැලෙන අනිකුත් සංවිධාන සමඟ සාකච්ඡා කොට ඉදිරිපත් කෙරුණි.

මෙම සංචාරයේ ඔහුගේ විශේෂ අවධානයට යොමු වී ඇති නූතන වහල්භාවීය සිදුවීම් නිහඩ වසංගතයක් ලෙස හඳුනාගෙන ඇති අතර, එහිදී වැඩකරන කාන්තාවන් මෙහි ගොදුරු බවට පත්ව ඇති බවද සඳහන් කර ඇත. එසේම ඇඟලුම් ක්ෂේත්‍රය තුලින් රටට විශාල විදේශ විනිමයක් ඉපැයීමට 78% ක්



පමණ වූ ශ්‍රම දායකත්වයක් සපයන ඇඟළුම් සේවිකාවන් පවතින ජීවන වියදමට අනුව සිය අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් වැටුප් නොලබන බවත් ශ්‍රම සූරාකෑමට ලක්ව ඇති බවත් සඳහන් කොට ඇත.

එසේම ඇඟළුම් කර්මාන්ත ආශ්‍රිත ව නිශ්චිත ආයතන රාමුවක් තුළ වහල් සේවය හා සූරාකෑම යන සාධක බරපතළ අන්දමින් ආයතන ගත වී ඇති බව ද සඳහන් කොට ඇත.

# සිතුවිල්ල

කලකින් ගමේ ගියෙත් නැහැ. සංචරණ නීතිය නැවත පනවන්න කලින් ගමේ ගිහින් එන්න ඕනේ මේ මාසයේ වැටුප ලැබුණාම. අම්මත් ලියා එවා තිබුණා තාත්තා මේ සැරේ කන්නය වපුරන්න පොහොර නැතුව ඔලුවෙ අත ගහගෙන පාළු කුඹුර දෙස බලාගෙන ඉන්නවා කියලා. ඉස්සර වෙල මැද සිටි පඹයන් පාරට බැහැලා මිනිස්සුන්ගෙන් ගුටි කනවා ලු නේද? අනේ මෙහෙම නාඩගම්. වකුගඩු පරිස්සම හොඳය. ඒත් අපි මේ කන වස විස වල හැටියට ඇටසැකිල්ලත් දිරලා ඇති. මේවට විකල්ප ක්‍රම හොයලා ඉන්න එපායැ මහ මොළකරුවන් තීන්දු තීරණ ගන්න කලින්. කොහෙද ඒ අයගෙත් එකමුතුකමක් නැහැනෙ. පේනවනෙ පාර්ලිමේන්තුව තුළ ඇති ඇනකොටා ගන්නා හැටි නූගත් පිරිසක් වගේ.

පෙර කාලයේ දී නම් පංච මහා බලකායක් තිබුනලුග සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියලා. රට තුළ ඇතිවන ප්‍රශ්න වලදී එයාලා මැදිහත් වුණා ලු. ඒකට දැන් අද ප්‍රශ්න ඇති කරන්නේ ඔය පස් ගොල්ලන් කියලා තාත්තා කිව්වා. උඹලා ඉතින් ඉතිහාසය ගැන මෙලෝ දෙයක් දන්නවැයි ගෙයි ගෙම්බෝ වගේ නේ. අඩුම ගානේ ඇහැලේපොළ කුමාරිහාමි දියේ ගිල්වා මැරුන හැටි, මද්දුම බණ්ඩාරගේ හිස ගසා මැරුව හැටි. ඒ කාලේ රට පාලනය කළ රජවරු නීතිය අකුරටම කළා වගේ. දැන් එහෙමද වරදට හිරේ ඇරිය ගමන් ලෙඩ වෙලා රෝහල් ගත වෙනවා. එහෙම ලෙඩ තිබුණා නම් කොහොමද අනේ රට පාලනය කරන්නේ.

ආ දුවේ තව එකක් කියන්න බැරි උනා. ඔය පැත්තෙ කඨින පිංකමටීමැනිකේ මගේ හිතේ සිංදුව පෙරහැරේ වාදන කරා කියලා අල්ලපු ගෙදර මැගිලින් කීවා. අනේ බං රටට ගිය කලක්. එක හුස්මට අම්මා එවූ ලිපිය කියවා ඇඳට වැටුණේ නිදා ගැනීමටය. ඒත් නින්ද අහලකවත් නැත. මාරාන්තික ඩෙංගු මදුරුවා මා අවට කැරකෙන්නේ මාවත් වලපල්ලට යවන්න වගේ. උනුත් එන්නේ අපිට අනින්න. අපේ කටු බොඩ් වලට ඇනලා තුඩ කඩා ගන්නේ නැතුව යනවලා දියවන්නා ඔය පැත්තට.

නොවැම්බර් මස ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සැමරුවට පෙරට වඩා රට තුළ ප්‍රචණ්ඩත්වය, හිංසනය සහ දූෂණය වැඩි වෙලා. ඒ මදිවට ගැහැණිය මරා හතර හන්දි කපා ගමන් මලුවල බහා පාරේ දමා යන්න තරම් මිනිස් සිත් දරුණු වෙලා. අභිරහස් ලෙස මරා දැමීම්, බාලවයස් ළමයින් ද උගතුන්ගේ ගොදුරුවෙලා. අති විශාල ශ්‍රම බලකායක් වෙළඳ කලාප තුළ සේවය කරනවා. වචනයකින් හෝ මේ අය ප්‍රචණ්ඩත්වයට ලක් වෙනවා. ඒවාට අපි එරෙහි වුනොත් මෙයාලා කතා කරන්නේ හරියට පත්තිනි අම්මලා වගේය. කලිසමක් ඇඳගෙන ගියොත් අද අයියා ගෙදර ද අභයි. පස්සට තට්ටු දාන අය අනන්තය. අහන කියන දේ අපමණය.

බඩු මිල ඉහළ යාමේ නිමක් නැහැ. බඩවියත රැක ගෙන සිටි පාන් ගෙඩියේ මිලත් ඉහල ගියා. ඒ මදිවට ගෑස් සිලින්ඩරයත් පුපුරන්න පටන් අරන්. හොඳ වෙලාවට මම නම් උයන්නේ භූමිතෙල් ලිපේ. සෞඛ්‍යයට අහිතකර වුණත් රට මේ යන ගැම්මට අපිටත් ගමේ යන්න වෙයිද දන්නෙ නැහැ.

සමන්තා

## බෝලෙ ෆෙල්

රටක් ඇත ලස්සන

මෝඩ රළක් ඇත ගස්සන

නරි හූ කියයි හැමතිස්සෙම

මෝඩ චූන් ලා නැලවෙයි කුණු අස්සෙම

අර පැත්තට මේ පැත්තට පාස් වෙයි බෝලේ

අපි හැමදාමත් වෙයි ෆෙල්

කුමුදුනි අබේරත්න

# ක්ෂේත්‍ර නිරාවරණ වැඩසටහන - කිලිනොච්චි වව්නියා සාමාජිකයින් හා නුවරඑළිය ගෝට් ෆෝල් තේවතු කම්කරුවන් සමඟ




28/11/2021 දින ක්ෂේත්‍ර නිරාවරණ වැඩසටහනක් සඳහා ඩාබිඳු සාමූහිකයේ කිළිනොච්චි වව්නියා සාමාජිකයින් සමඟ නුවරඑළිය රාගල ප්‍රදේශයේ තේවතු කම්කරුවන් හා එක්ව නුවර මානව සංවර්ධන ආයතනයේ සහයෝගීත්වයෙන් පැවැත්විණි.

වතුයායේ කම්කරුවන් හා පෙර පාසැල් දරුවන්ද අපව ඉතාමත් සුහද ලෙසින් පිළි ගනිමින් ඔවුන්ගේ කටුක අත්දැකීම් අප හා බෙදා ගන්නා ලදි.

වැඩසටහනේ අරමුණු පැහැදිලි කරමින් නුවර මානව සංවර්ධන ආයතනයේ වැඩසටහන් අධ්‍යක්ෂිකා ක්‍රිෂ්ණන් යෝගේෂ්වරී සහෝදරිය කරුණු පැහැදිලි කල අතර ඩාබිඳු සාමූහිකය වෙනුවෙන් වැඩසටහන් සම්බන්ධීකාරිණී චමිලා තුෂාරී ද අදහස් එල කරන ලදි.

එසේම වතු කම්කරුවන්ගේ වෘත්තීය අත්දැකීම් බෙදා ගැනීම තුළදී ලංකාවේ අපනයන ආදායමට මහගු සේවයක් සපයන වතු කම්කරුවන්ගේ ජීවන තත්වය ඉතාමත් පහළ තත්වයක පවතින අතර රු.15000 වැනි අවම වැටුපක් ලබා ගැනීමට නිෂ්පාදන ඉලක්ක සපුරාලිය යුතු බවද කුඩා කාමර පේලිවල මුළු පවුලම එකටජීවත් වීමේදී පිරිසිදු පානිය ජලය නොමැති බවත් පවුල් කීහිපයකටම එකම ජල කරාම භාවිත කිරීමට සිදුවීම, ගැබිණි මව්වරුන්ට ප්‍රමාණවත් පරිදී සායන පහසුකම් නොමැතිකම මෙන්ම පැවති ගිලන්රථ පහසුකම් පවා මේ වන විට ලබා දීමට කටයුතු නොකරන බවද ග්‍රාම නිළධාරීතුමන්ලා සිංහල වීම නිසා භාෂා ගැටළු පවතින බවද රජයෙන් ලැබිය යුතු සුබ සාධන පහසුකම් මේ වතුයායට නොලැබෙන තරම් බවද පවසන කම්කරුවන් ප්‍රමාණවත් පරිදී වෛද්‍යවරුන් නොමැති බවද සමෘද්ධි පහසුකම් නොලැබෙන බවද ස්වාභාවික ආපදා වලදී ටකරං වැනි දෑ ලබා දුන්නද මේ වන විට ඒවා කපා හැර ඇති බවද වත්තේ වැඩ කරන්නේ නැත්නම් ඉඩම් අයිතිය අහිමිවන බවද, රජයෙන් ලබාදෙන සේවාව වල කිසිදු තත්ත්වයක් නොමැතිබවද විදුලිය පහසුකම් නොමැති බවද මෙම නිරාවරණයෙදී අනාවරණය විය.

ඒ වගේම උතුරේ ඇඟළුම් කර්මාන්තයේ අත් දැකීම් බෙදා ගත් භවධරණී සහෝදරිය පවසා සිටියේ යුධවාතාවරණයක් තුළ දිවි ගෙවූ ඔවුන් ගෘහමූලික කාන්තාවන් ලෙස ලද අත්දැදීම් හා තනි මව්වරුන් සේ ගෙවන දිවියද කර්මාන්තශාලා පරිශ්‍රයේදී විදින කම්කරු නීති උල්ලංගණය වීම් වලට සාමූහිකවී විසදුම් ලබා ගැනීමට කරන උත්සහයන් පිළිබඳවද මෙහිදී අත්දැකීම් බෙදා ගන්නා ලදි.



අවසානයේදී මේ පිළබඳව කළ ඇගයීමේදී අපගේ සාමාජිකයින් පවසා සිටියේ සමහර සේවකයින් වතු ක්ෂේත්‍රයේ අත්දැකීම් ලබා ගැනුමට ආ ප්‍රථම අවස්ථාව බවද ලයින් කාමර වල ගෙවන ජීවිත ඉතාමත් දුක්බදායක බවද අයිතීන් සම්බන්ධව ඊට වඩා දැනුවත් වී ඒකරාශී විය යුතු බවද ඔවුන්ගේ ජීවන තත්වය ඇස්දෙකෙන් දැක ගෙන ඒ යතාර්ථය අවබෝධ කර ගැනීමට අවස්ථා සලසා දීම සම්බන්ධයෙන් ඩාබිඳු සාමූහිකයට ස්තූති වන බවද අපගේ සාමාජිකයින් පවසා සිටින ලදි.

මෙම නිරාවරණ වැඩසටහන සාර්ථක කරගැනීමට අපට සහයෝගය දැක්වූ නුවර මානව සංවර්ධන ආයතනයේ ක්‍රිෂ්ණා යෝගේෂ්වරී සහෝදරිය ඇතුළු අම්බිගා හා ක්‍රිෂාන්ති සහෝදරියන්ට ස්තූතිවන්ත වෙමු.



3 පිටුවෙන්... **ගැබ්ගෙල පිළිකාවට**

පැප් පරීක්ෂණය සාමාන්‍යයෙන් සිදු වන්නේ නිරෝගී කාන්තාවන් සඳහායි. වයස අවුරුදු 35 ඉක්මවූ විවාහක කාන්තාවන්ට අදාල සායනයකදී පැප් පරීක්ෂාව සිදු කළ හැකියි. ඒ වගේම ලිංගික සබඳතා පවත්වන කාන්තාවන් ප්‍රථම එක්වීමෙන් වසර පහකට පසු පැප් පරීක්ෂාව සිදු කර ගැනීම වැදගත්.

## ගැබ්ගෙල පිළිකා අවදානම ඇති කාන්තාවන් කවුද...?

- මානව පැපිලෝමා වෛරස ආසාදිත කාන්තාවන්
- අඩු වයසකදී ලිංගික එක්වීමට පත් කාන්තාවන්
- බහු පුරුෂ සේවනයේ යෙදෙන කාන්තාවන්
- බහු ස්ත්‍රී සේවනයේ යෙදෙන පුරුෂයින් සමඟ ලිංගික සේවනයේ යෙදෙන කාන්තාවන්
- අක්‍රිය හෝ සක්‍රිය ලෙසින් දුම්පානයට සම්බන්ධ කාන්තාවන්
- විවිධ රෝග සඳහා ප්‍රතිශක්තිකරණ හීනකරවන ඖෂධ භාවිත කරන කාන්තාවන්
- ලිංගිකව බෝවන රෝගවැළඳී ඇති කාන්තාවන්

පිළිකා කාරක මානව පැපිලෝමා වෛරසය මඟින් සිරුරේ DNA සහ ආසාදිත සෛලවල දරුණු වෙනස්කම් ඇති කර ඒවා පිළිකා බවට පත් වීමේ ඉඩකඩ ඇති කරනවා. වෛරසය යෝනි මාර්ගයෙන් හෝ මුඛය, ගුදය වැනි අවයව ඔස්සේ පැතිරීම සිදු වෙනවා පමණක් නොව ගුදයේ ශිෂ්ණයේ මෙන්ම හිස, ගෙල ප්‍රදේශයේ ඇති වෙන ඇතැම් පිළිකා සමග සම්බන්ධතාවයක් දක්වනවා.


## එන්නතෙ හි ප්‍රතිඵල විශ්මය ජනකයි...

මෙම එන්නත මාත්‍රා දෙකකින් යුක්ත වන අතර සයමසක පරතරයකින් යුක්තව ලබා ගත යුතුයි. මේ වෙන විටත් මානව පැපිලෝමා එන්නතේ ආරක්ෂාව ගැන තහවුරු වීම ලබාගෙන තිබෙනවා. ලැන්සෙට් වාර්තාවට අනුව 2008 වසරේදී මෙම මානව පැපිලෝමා එන්නත ලබා ගත් දරුවන් මේ වන විට වැඩිහිටි වයසේ පසුවෙනවා. අධ්‍යයනයෙන් හඳුනා ගෙන ඇති අන්දමට ඔවුන් පූර්ව පිළිකා වර්ධන තත්ත්වයෙහි දී ගැබ්ගෙල පිළිකා අවදානම සඳහා 87% ක ආරක්ෂාවක් ලබා ඇති බවයි. ඒ නිසා මෙහි බලපෑම ඉතා විශාල බැව් ලන්ඩනයේ කිංස් විශ්ව විද්‍යාලයේ පර්යේෂණ සාමාජික මහාචාර්ය පීටර් සසෙයිනි සඳහන් කරනවා.

උපුටා ගැනීම ආන්තර්ජාලය ඇසුරෙන්

කම්කරු පුවත්



# කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම

2021/10/10 වන දින බියගම කම්කරුවන්හට (දමිල සහ සිංහල) කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්විණි.

මෙහිදී කම්කරු නීති යටතේ අතිකාල, නිවාඩු, මාතෘ ප්‍රතිලාභ හා සාමූහික කේවල් කිරීම පිළිබඳව සේවකයන් දැනුවත් කරන ලදී. ඒ සඳහා සම්පත් දායකත්වය සපයනු ලද්දේ නීතිඥ ස්වස්ථිකා අරුලිංගම් සහ නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර විසිනි.

එයට සම්බන්ධ වූ දමිළ සේවිකාවන්ගේ බහුතරයක් මෑන් පවර් හරහා සේවය කරන බැවින් ඒ සම්බන්ධව නීති සම්පාදනය වී නොමැති නිසා මෙම කම්කරුවන් පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතු බව සම්පත්දායිකා විසින් පවසන ලදී. එසේම මෙම දමිළ සේවිකාවන් මඩකලපුව, යාපනය සහ හැටන් යන ප්‍රදේශවලින් පැමිණි අය බවත් මෑන්පවර් සේවය සඳහා යොමු වන්නේ සිය ගම් වල සිටින දරුවන් බැලීමට සඳහා මාස තුනකට වරක් දින පහක නිවාඩුවක් ගැනීමට ඇති නිසා බවත් පැවසීය.

එසේම තම දරුවන් තමන්ගේ ඥාතීන් ළඟ තබා පැමිණෙන බවත්, සමහර දරුවන්ට පාසල් අධ්‍යාපනය නොලැබෙන බවත් ඔවුන් පවසන ලදී. එමෙන්ම මෙම සේවිකාවන්ගෙන් සමහරු මෙම රැකියාවට ඒමට අවශ්‍ය මුදල් පොලියට ගෙන තිබුණු අතර මාස හයක් ගතවී ගිය ද එම මුදල් පියවීමට නොහැකි වූ බවද පවසන ලදී.

එසේම කොවිඩ් අර්බුද අවස්ථාවලදී රැකියා අහිමිවීම, සුභසාධන ප්‍රතිලාභ අහිමිවීම, නේවාසික කුලිය ගෙවා ගැනීමට නොහැකි වීම සහ ගමට යෑමට නොහැකිව ප්‍රදේශය තුළ පිහිටක් නොමැතිව අසරණ වූ බවද පැවසීය.

මෙහිදී සේවකයන් සමාජ සංරක්ෂණය, රැකියා සුරක්ෂිතභාවය, ධාරකාගාර පහසුකම් නොමැතිවීම, භාෂා ගැටළුව, නිසි පරිදි සෞඛ්‍ය ආරක්ෂණ පහසුකම් නොමැති වීම සහ ඒ සඳහා වැඩි පිරිවැයක් දරන්නට සිදුවීම වැනි ගැටලු ඉදිරිපත් කරන ලදී.

අංකඃ 221, වෙළබඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.